

LIRNEasia
Pro-poor. Pro-market.

# ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවේශය සහ භාවිතය

## වැඩි වශයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය[1] = ඉහළ ව්‍යාපාර සාර්ථකත්වය

- x2.8 ආදායමක්
- x2 ලාභයක්
- x1.8 පාරිභෝගිකයන්
- ප්‍රාදේශීය, දේශීය, සහ විදේශීය පාරිභෝගිකයන්[2] සහ සැපයුම්කරුවන්ගේ[3] පුළුල් පරාසයක්
- ඉහළ බැංකු භාවිතාවක්[4]

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (සු.ම.ප.) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (තො.ස.තා.) යොදාගන්නේ කුමක් සඳහාද*?

*සියලු සු.ම.ප ව්‍යාපාරයන්ගේ ප්‍රතිශතයක් ලෙස




## සු.ම.ප. ව්‍යාපාරයන් අතර උපාංග අයිතිය සහ භාවිතය*

| 62% | 41% | 20% | 14% | 12% | 7% | 6% | 3% |
|---|---|---|---|---|---|---|---|
| ජංගම දුරකථන | ස්ථාවර දුරකථන | ලැප්ටොප් පරිගණක | ඩෙස්ක්ටොප් පරිගණක | මුද්‍රණ යන්ත්‍ර | ෆැක්ස් යන්ත්‍ර | විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර | ටැබ්ලට්/අයිපෑඩ් |

1. පවතින තො.ස.තා. දර්ශක මත පදනම්ව ව්‍යාපාර “වැඩි” සහ “අඩු” තො.ස.තා. භාවිත කරන්නන් ලෙස වර්ගීකරණය කිරීම සඳහා දෙපියවර පොකුරුකරණය භාවිත කරන ලදී. සු.ම.ප. ව්‍යාපාර අතර තො.ස.තා. භාවිත කිරීමේ මධ්‍යන්‍ය අගය 6 ක් සහ උපරිමය 29 ක් විය. වැඩි වශයෙන් තො.ස.තා. භාවිත කරන ව්‍යාපාර අතර මධ්‍යන්‍ය අගය 13 ක් වන අතර අඩු වශයෙන් තො.ස.තා. භාවිත කරන ව්‍යාපාර අතර මධ්‍යන්‍ය 4 ක් විය.
2. තො.ස.තා. වැඩි වශයෙන් භාවිත කරන සු.ම.ප. ව්‍යාපාරවලට 26% ප්‍රාදේශීය, 33% දේශීය, සහ 41% ජාත්‍යන්තර පාරිභෝගිකයන් සිටින අතර තො.ස.තා. අඩු වශයෙන් භාවිත කරන සු.ම.ප. ව්‍යාපාරවලට ඇත්තේ 81% ප්‍රාදේශීය හා 19% දේශීය ගනුදෙනුකරුවන් පමණි.
3. තො.ස.තා. වැඩි වශයෙන් භාවිත කරන සු.ම.ප. ව්‍යාපාරවලට 15% ප්‍රාදේශීය, 39% දේශීය, සහ 49% ජාත්‍යන්තර සැපයුම්කරුවන් සිටින අතර තො.ස.තා. අඩු වශයෙන් භාවිත කරන සු.ම.ප. ව්‍යාපාරවලට ඇත්තේ 72% ප්‍රාදේශීය, 25% දේශීය, සහ 6% අන්තර්ජාතික සැපයුම්කරුවන් පමණි.
4. තො.ස.තා. වැඩි වශයෙන් භාවිත කරන සු.ම.ප. ව්‍යාපාරවලින් 88% ට ව්‍යාපාරය සඳහාම කැපවූ බැංකු ගිණුමක් ඇති අතර තො.ස.තා. අඩු වශයෙන් භාවිත කරන සු.ම.ප. ව්‍යාපාරවලින් ඒ සඳහාම වූ බැංකු ගිණුමක් අත්තේ 21% ට පමණි.

## ස්ථාවර දුරකථන භාවිත කරන්නේ සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් 41% ක් පමණි

භාවිත නොකිරීමට හේතුව (ස්ථාවර දුරකථන භාවිත නොකරන සු.ම.ප. ව්‍යාපාරයන්ගේ ප්‍රතිශතයක් ලෙස):




## තමන්ගේම පරිගණක භාවිත කරන්නේ සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් 28% ක් පමණි

පරිගණකක් අයිති නොවීමට හේතුව (පරිගණක භාවිත නොකරන සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස):




## අන්තර්ජාලය හෝ සමාජ මාධ්‍ය භාවිත කරන්නේ සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් 40% ක් පමණි

භාවිත නොකිරීමට හේතුව (අන්තර්ජාලය හෝ සමාජ මාධ්‍ය භාවිත නොකරන සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස):




## ජංගම මූල්‍ය සේවාවන් භාවිත කරන්නේ සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් 4% ක් පමණි

භාවිත නොකිරීමට හේතුව (ජංගම මූල්‍ය සේවාවන් භාවිත නොකරන සු.ම.ප. ව්‍යාපාරයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස):




AfterAccess ව්‍යාපාර සමීක්ෂණය මගින් ශ්‍රී ලංකාව තුළ සුළු හා මාධ්‍ය පරිමාණ (සු.ම.ප) ව්‍යාපාර මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ (තො.ස.තා.) ප්‍රවේශය හා භාවිතය අධ්‍යනය කිරීමට යත්න දරන ලදි.

- කෘෂිකාර්මික නොවන ව්‍යාපාර
- සේවක සංඛ්‍යාව මත පදනම් සු.ම.ප ව්‍යාපාර වර්ගීකරණයක්
- ආර්ථික ක්‍රියාකාරකම් වර්ගීකරණය සඳහා “ජාතයන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණය” (ISIC)
- ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ශ්‍රී ලංකා ආර්ථික සංගණනය අනුව සු.ම.ප. ව්‍යාපාර අර්ථ දක්වන ලදී



**නියැදි ස්ථානවල විසිරිය**

## ක්‍රමවේදය:

- පළාත් නවය (9) හි ග්‍රාම නිලධාරී වසම් (GND) 100 ක පැතිරුණු සු.ම.ප. ව්‍යාපාර 403 ක් තෝරා ගැනීම
- 2012 ශ්‍රී ලංකා ජන හා නිවාස සංගණනයේ, ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ දත්ත මත පදනම්වූ නියදුම් රාමුවක් භාවිත කරමින්, මුලු දිවයිනම නිරූපනය වන පරිදි සු.ම.ප. ව්‍යාපාර නියදියක් තෝරා ගැනීම
- දර්ශක සඳහා ±9.8% දෝෂ සීමාවක් හා 95% ක විශ්‍රම්භ ප්‍රාන්තරයක් ඇත
- නාගරික-ග්‍රාමීය හා ව්‍යාපාර අංශය මට්ටමේ දත්ත විශ්ලෙශනයන් ඉහල දෝෂ සීමාවක් සමග සිදු කල හැක
- පළාත, දිස්ත්‍රික්ක හෝ ග්‍රාම නිලධාරී වසම අනුව දත්ත විශ්ලේෂණය කළ නොහැකිය
- 2018 නොවැම්බර් සිට 2019 ජනවාරි කාල පරාසය තුළ දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදි

ජංගම උපාංග භාවිතයෙන් දත්ත එක්රැස් කර දෛනිකව විමර්ශනය කරන ලද අතර සමීක්ෂණ කණ්ඩායම්වල සංචරණය GPS තාක්ෂණය මගින් සජීවීව අධීක්ෂණය කරන ලදී.

එකතු කරන ලද මූලික දත්ත, ඇතැම් ජනගහණ උප කාණ්ඩවල අධි-නියැදීම හා අඩු-නියැදීම නිවැරදි කිරීමට 2018 මධ්‍ය වාර්ශික ජාතික ජනගහන ඇස්තමේන්තු භාවිත කර බර තබන ලදී.

## AFTERACCESS

AfterAceess සමීක්ෂණ පවත්වනු ලබන්නේ දිළිඳු ජන හිතවාදී සහෝදර ජාලයන් වන DIRSI, LIRNEasia සහ Research ICT Africa විසිනි. AfterAccess සමීක්ෂණ සමස්ත රාජ්‍යම නිරූපණය වෙන ලෙස සැලසුම් කර ඇති අතර, ගෝලීය දකුණේ රටවල් 23 ක් (ආසියාවේ 7 ක්, අප්‍රිකාවේ 10 ක් සහ ලතින් ඇමරිකාවේ 6 ක්) සැසඳිය හැකි ලෙස මෙම සමීක්ෂණ ක්‍රමවේදය නිර්මාණය කර ඇත. AfterAccess යනු ගෝලීය දකුණේ ජංගම දුරකථන සහ අන්තර්ජාල ප්‍රවේශය සහ භාවිතය පිළිබඳව ඇති පුළුල්ම දත්ත සමූහයයි.

AfterAceess සමීක්ෂණ 2018 EQUALS In Tech Awards උළෙලේදී ‘පරේය්ෂණ’ කාණ්ඩයේ ජයග්‍රාහකයන් ලෙස පිළිගැනීමට ලක්විය.

afteraccess.net | @AfterAccess

## LIRNEASIA

LIRNEasia යනු දිළිඳු ජනයා වෙනුවෙන්, වෙළඳපළ උදෙසා වූ ඩිජිටල් ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩලයකි. එහි මෙහෙවර, පරේය්ෂණ මගින් රාජ්‍ය ප්‍රතිපත්ති උත්ප්‍රේරණය කර, දැනුම, තොරතුරු සහ තාක්‍ෂණය තුලින් දෘඩ හා මෘදු යටිතල පහසුකම් භාවිත කිරීමට පහසුකම් සලසා, එමගින් නැගී එන ආසියා පැසිෆික් කලාපයේ ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීමයි. ඉල්ලුම-හා-සැපයුම් පරේය්ෂණවල නියැලීම මෙන්ම විවෘත දත්ත, ස්ත්‍රී පුරුෂ සමාජභාවය (පුම්තිරිබව), විසල් දත්ත (Big Data) වැනි අභියෝග වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා උපදේශනය ලබා දීම වැනි ක්‍රියාකාරකම් තුලින් LIRNEasia 2005 සිට ආසියා පැසිෆික් කලාපයේ ක්‍රියාකාරීව සිටී.

lirneasia.net | @LIRNEasia

LIRNEasia
Pro-poor. Pro-market.

lirneasia.net/SMESL